*සැ. යු.* - 2019.04.05 දින පළ වූ අංක 2,118 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,119 - 2019 අප්‍රේල් මස 12 වැනි සිකුරාදා - 2019.04.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 868 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 872 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 878 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 මැයි මස 03 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 අප්‍රේල් මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ
පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත විස්තර සඳහන් ප්‍රාථමික ශිල්පීය නොවන සහ ප්‍රාථමික ශිල්පිය ගණයේ තනතුරු සඳහා වයඹ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2008.11.19 සහ 2009.05.12 යන දිනවල අනුමත කර ඇති බඳවාගැනීමේ පටිපාටිවල සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වසර 03 කට වැඩි කාලයක් ස්ථිර පදිංචි ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *සේවක ගණය* | *බඳවාගන්නා ශ්‍රේණිය* | *බඳවාගන්නා පදනම* | *බඳවාගන්නා සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|---|---|
| රියදුරු | ප්‍රාථමික ශිල්පීය (PL 3) | III | ස්ථිර | 2 | රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 |

ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණය (රියදුරු) පුරප්පාඩුවලින් 50% බාහිර අයදුම්කරුවන්ගෙන් ද 50%ක් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් ද පුරවනු ලැබේ. සුදුසුකම් සම්පූර්ණ කළ අභ්‍යන්තර අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විට එම ප්‍රමාණය බාහිර අයදුම්කරුවන්ගෙන් ද සුදුසුකම් සම්පූර්ණකර බාහිර අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැතිවිට එම ප්‍රමාණය අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් ද ප්‍රතිශතය නොසලකා පුරවනු ලැබේ.

| *තනතුර* | *සේවක ගණය* | *බඳවා ගන්නා ශ්‍රේණිය* | *බඳවා ගන්නා පදනම* | *බඳවා ගන්නා සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|---|---|
| වැඩ/ක්ෂේත්‍ර කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන (PL-1) | III | ස්ථිර | 1 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 |
| නළ ළිං පොම්ප ක්‍රියාකරු | ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL - 2) | III | ස්ථිර | 1 | රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 |

*රියදුරු තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් -*

*අධ්‍යාපන සුදුසුකම් :*

* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් විෂයන් දෙකකට සම්මාන සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම. (වෛකල්පිත විෂය හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයන් 05 ක් සමත් ව තිබිය යුතුය.

* වාහන රියදුරෙකු ලෙස වසර 03ක පළපුරුද්ද අවශ්‍ය වේ.

* තාරබර හොන්ඩර් 34 ට වැඩි බර මෝටර් වාහන, බර ටේලර් සහ මගීන් 32 ක ට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (A පන්තියේ රියදුරු බලපත්‍රයක්)

* අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය.

*නල ළිං පොම්ප ක්‍රියාකරු -*

අධ්‍යාපන සුදුසුකම් :

* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් විෂයන් දෙකකට සම්මාන සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම. (වෛකල්පිත විෂයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයන් 05 ක් සමත් වී තිබිය යුතුය.
* වෘත්තියට අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක/රාජ්‍ය සංස්ථා/මණ්ඩල/ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් රජයේ ආයතනයක යටත් පිරිසෙයින් වසර 2 කට වැඩි කාලයක් සේවය කර තිබීම (එය NVQ සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)

*වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් :-*

අධ්‍යාපන සුදුසුකම් :

* 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම.

*ඉහත සියලු තනතුරු සඳහා අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

(i) සියලුම අයදුම්කරුවන් වයස අවුරුදු 18-45 ත් අතර විය යුතුය. (දැනටමත් වයඹ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරුවල සේවය කරන අයට උපරිම වයස් සීමාව බලනොපැවැත්වේ.)

(ii) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

(iii) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය.

(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

(v) වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 ක පදිංචිකරුවෙකු බව සනාථ කිරීමේ ග්‍රාම සේවා සහතිකය ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන් සහිතව ඉදිරිපත් කළ යුතුය.

(vi) දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් ඔහු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

(vii) අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාලසීමාවේදී හෝ මෙම බඳවාගැනීම් ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක සහ අදාල වන පරිදි වෘත්තීය ප්‍රවීණතාව තහවුරුකර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ. දැනටමත් ස්ථිර/අනියම්/ආදේශක/ගිවිසුම් මත සභාවේ සේවය කරන සේවකයින් සඳහා ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ. මූලික සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

ඉහත ස්ථිර තනතුරු සඳහා තෝරා ගන්නා අයදුම්කරුවන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් විය යුතු වේ. එම කාලය තුළ සිය රාජකාරි වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේනම් පරිවාස කාලය අවසානයේ සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ. චක්‍රලේඛ විධිවිධාන පරිදි වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

*අයදුම්පත් එවිය යුතු පිළිවෙල :*

සියලුම අයදුම්කරුවන් මෙහි පහතින් ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කරගත් අයදුම්පත් 2019.05.06 දිනට පෙර ලැබෙන සේ ''ලේකම්, වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව, පුත්තලම'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු වේ :

(i) උප්පැන්න සහතිකය;
(ii) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත;
(iii) අධ්‍යාපන සහතික;
(iv) ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා හා පළපුරුද්ද පිළිබඳ සහතිකය;
(v) අදාල වන පරිදි රියැදුරු බලපත්‍රය;
(vi) ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී සහතිකය;
(vii) අදාල වන පරිදි රියැදුරු වශයෙන් වසර 03කට වැඩි පළපුරුද්ද පිළිබඳ සේවා සහතිකය;
(viii) ඔබ දැනට යම් ආයතනයක සේවයේ නියුතු වන්නේ නම් එම ආයතනයෙන් ලබා ගත් සේවා සහතිකයක්
(පළ කිරීම්වල භාෂාමය ගැටලුවක් පැන නැගුනහොත් සිංහල භාෂාවේ නිවැරදි බව සලකනු ලැබේ.)

එච්. එම්. අයි. බී. හේරත්,
ලේකම්,
වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව.

2019 අප්‍රේල් මස 04 වැනි දින,
වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව**

***වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පුරප්පාඩු වී ඇති............................................... තනතුර සඳහා බඳවා ගැනීම***

| |
|---|
| |

කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි.

01. මුලකුරු සමග නම :..........................................................................................................
(සිංහලෙන්/ඉංග්‍රීසියෙන්)

02. මුලකුරුවලින් හැඳින්වෙන නම :..........................................................................................
(සිංහලෙන්/ඉංග්‍රීසියෙන්)

03. ලිපිනයඃ
(i) පෞද්ගලික ලිපිනය :..........................................................................
(ii) රාජකාරි දුරකථන අංය :..........................................................................

04. දුරකථන අංකය ඃ
(i) පෞද්ගලික දුරකථන අංකය :..................................................
(ii) රාජකාරි දුරකථන අංකය :..................................................

05. උපන් දිනය -
2019.05.06 දිනට වයස :
අවුරුදු :........................ මාස :........................ දින :........................
06. ජාතික හැඳුනුම්පත් අංකය :.....................................................

07. ස්ත්‍රී/පුරුෂ භාවය :..................:......................

08. අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය (ප්‍රථම/දෙවන/තෙවන) ඃ

විභාග අංකය :..................... වර්ෂය :.....................
මාධ්‍යය :.....................

| | සමත් වූ විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| i. | ………………………………… | ………………… |
| ii. | ………………………………… | ………………… |
| iii. | ………………………………… | ………………… |
| iv. | ………………………………… | ………………… |
| v. | ………………………………… | ………………… |
| vi. | ………………………………… | ………………… |
| vii. | ………………………………… | ………………… |
| viii. | ………………………………… | ………………… |
| ix. | ………………………………… | ………………… |
| x. | ………………………………… | ………………… |

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය (ප්‍රථම/දෙවන/තෙවන)

විභාග අංකය :………………… වර්ෂය :…………………

මාධ්‍යය :…………………

| | සමත් වූ විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| i. | ………………………………… | ………………… |
| ii. | ………………………………… | ………………… |
| iii. | ………………………………… | ………………… |
| iv. | ………………………………… | ………………… |

09. වෘත්තීය සුදුසුකම්/පළපුරුද්ද :………………………………………………………………………………………
…………………………………………………………………………………………………………………
…………………………………………………………………………………………………………………

10. දැනට යම් තනතුරක් දරන්නේනම් ඒ පිළිබඳ විස්තර :

i. ආයතනයේ නම :…………………………………………
ii. තනතුර සහ ශ්‍රේණිය :…………………………………………
iii. පත් වූ දිනය :…………………………………………
iv. සේවා සහතිකය :…………………………………………

11. මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති සියලු තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවද මෙහි සපයා ඇති යම් තොරතුරක් වැරදි හෝ අසත්‍ය බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් නුසුදුස්සකු වන බවත් පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් පත්වීම් අවලංගු කළ හැකි බවත් මා දනිමි.

…………………………
අයදුම්කරුගේ අත්සන.

දිනය :……………………

12. *ආයතන ප්‍රධානියාගේ සහතිකය :*
(දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන...................................................................... මහතා/මහත්මිය....................................... වැනි දින සිට කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම සහ හැසිරීම සතුටුදායක බවත්, ඉහත 01 සිට 10 දක්වා ශීර්ෂවල සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පෞද්ගලිකවම පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් 2019 ..............................මස ..........................වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

…………………………
ආයතන ප්‍රධානියාගේ/ඔහුගේ බලයලත් නිලධාරියාගේ
අත්සන සහ මුද්‍රාව.

දිනය :……………………

04-609

# පළාත් පාලන නිවේදන

## මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව ත්‍රීරෝද රථ නැවතුම්පලවල් සඳහා අදළ වන අතුරු ව්‍යවස්ථා යටතේ ත්‍රීරෝද රථ නැවතුම්පලවල් ප්‍රකාශයට පත් කිරීම

මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2018.02.02 දින අංක 2057 දරන *ගැසට් පත්‍රය* මගින් වැළඳගෙන ඇති මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් 2016.02.23 දින අංක 1955/7 දරන සම්මත අතුරු ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව බල ප්‍රදේශයේ පහත පලවන උපලේඛනයේ සඳහන් ත්‍රීරෝද රථ නැවතුම් පලවල් 2018.07.12 වන දින මහ සභා තීරණ අංක 05.02 සහ 2018.12.27 මහ සභා තීරණ අංක 05.19 යන යෝජනාවන් පහත සඳහන් උපලේඛනය පරිදි ත්‍රීරෝද රථ නැවතුම් පලවල් සභා සම්මත කරන ලද බව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආර්. එම්. පී. ඩබ්. එම්. එස්. බී. යටවර,
සභාපති,
මහනුවර කඩවත් සතර සහ ගඟවට
කෝරළේ ප්‍රාදේශීය සභාව.

උපලේඛන

1. පහළ තැන්නේ කුඹුර ත්‍රීරෝද රථ නැවතුම්පල
2. හාරගම බස්නැවතුම්පල අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
3. සිල්වා මෝටර්ස් තැන්නේකුඹුර ත්‍රීරෝද රථ නැවතුම්පල
4. තේක්ක වත්ත හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
5. හාරගම 3 කණුව හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
6. ගුරුදෙණිය හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
7. මහකන්ද හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
8. පැණිදෙනිය ඉන්ධන පිරවුම්හල අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
9. ගුරුදෙනිය දඹවෙල හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
10. ලෙව්ල, කොස්හින්න හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
11. ඇල්හේන හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
12. මැද්දේගම හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
13. ජයලංකා හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
14. සෙමනේරිය හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
15. උඩුවෙල පාර හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
16. හිඳගල හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
17. පේරාදෙණිය ගම්පල බස්නැවතුම්පල අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
18. අම්පිටිය මැද්දේලම 10 කණුව අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
19. හීරැස්සගල පල්ලිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
20. බෝවලවත්ත පිට්ටනිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
21. සරසවිගම අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
22. ගුඩ්හෝප් හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
23. උඩපේරාදෙණිය ගොවිජන සේවා මධ්‍යස්ථානය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
24. ඉඑක්මෝදර තලපියන්නාව පාරට හැරෙන හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
25. කොළඹ පාර බෝගහ අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
26. අම්පිටිය දිවුරුම් බෝධිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
27. අම්පිටිය තුනේ කණුව ත්‍රීරෝද රථ නැවතුම්පල
28. පිච්චමල්වත්ත හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
29. වාලමලේ බෝගහ අසල ත්‍රීරෝද රථ නැවතුම්පල

30. මී කණුව දෙවන සුරුවම අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
31. මී කණුව බස් නැවතුම්පල අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
32. දඹවෙල පාසල අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
33. මාලිගාතැන්න හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
34. ඔගස්ටාවත්ත මාරගස් හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
35. වැවතැන්න හන්දිය ඉදිරිපිට අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
36. තැන්නේකුඹුර පුස්තකාලය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
37. ශ්‍රී සුගතාරාම විහාරස්ථානයේ පිවිසුම් මාර්ගය ඉදිරිපිට ත්‍රීරෝද රථ නැවතුම්පල
38. ශ්‍රී ශාන්තාරාම විහාරස්ථානය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
39. සිටිමිෂන් වටරවුම පාර අසල ත්‍රීරෝද රථ නැවතුම්පල
40. මුස්ලිම් පල්ලිය ඉදිරිපිට තේක්ක වත්ත හන්දිය අසල ත්‍රීරෝද රථ නැවතුම්පල

04-218

---

## මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි ප්‍රජා මණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම, ඒවායේ කාර්ය හා කර්තව්‍යය තීරණය කිරීම සහ නියාමනය කිරීම පිළිබඳව සම්මත අතුරු ව්‍යවස්ථාව

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලය ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123 උපවගන්තිය ප්‍රකාරව පහත සඳහන් යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. පී. ඩබ්. එම්. එස්. බී. යටවර,
සභාපති,
මහනුවර කඩවත් සතර සහ
ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව,
අම්පිටිය.

2019 පෙබරවාරි මස 22 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළයේ ප්‍රාදේශීය සභාවේ දීය.

**යෝජනාව**

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2018.09.25 දින අංක 2090/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද්දා වූ මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශයන්හි ප්‍රජා මණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම, ඒවායේ කාර්ය හා කර්තව්‍යය තීරණය කිරීම සහ නියාමනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙම යෝජනාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123 උප වගන්තියෙන් මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018.12.27 වැනි දින පැවති මහා සභා තීරණ අංක 05.08 යටතේ සභාව යෝජනා කරන්නීය.

04-219

**විල්ගමුව ප්‍රාදේශීය සභාව**

සම්මත අතුරු ව්‍යවස්ථාව

**1952 අංක 06 දරණ පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

261 වන අධිකාරිය වන 1952 අංක 06 දරණ පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 3 වන වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 93 වන වගන්තිය සහ 126 වැනි වගන්තියේ 9 වැනි උප වගන්තියේ (අ) සහ (ඇ) ඡේද වලට ප්‍රකාරව පහත සඳහන් තීරණය මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. ජී. තෙන්නකෝන්
සභාපති
විල්ගමුව ප්‍රාදේශීය සභාව.

2019 පෙබරවාරි මස 12 වැනි දින
විල්ගමුව ප්‍රාදේශීය සභාවේ දී ය.

*තීරණය*

1989 අංක 12 දරණ පළාත් සභා (අනුසාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරණ පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මධ්‍යම පළාත්, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 වැනි දින අංක 1816/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ හා මධ්‍යම පළාත් සභාව විසින් (2012.05.24) අනුමත කොට 2013.06.28 වැනි දින 1816/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) වැනි කොටසේ පළ කරනු ලැබූ නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද්දා වූ පහත සඳහන් කොට ඇති අතුරු ව්‍යවස්ථාව,

01. මධ්‍යම පළාතේ ප්‍රදේශීය සභා බල ප්‍රදේශයෙහි ඝන අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

මෙම තීරණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමටත්, ඊට පෙර දින මධ්‍යම රාත්‍රි 12 සිට මීට පෙර ඉහතින් සඳහන් කරන්නට යෙදුනු අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් විල්ගමුව ප්‍රදේශීය සභා බල ප්‍රදේශය තුල බලාත්මක වූ සියළුම අතුරු ව්‍යවස්ථා අවලංගු කිරීමටත් හා 1987 අංක 15 දරණ ප්‍රදේශීය සභා පනතේ 09 (03) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 පෙබරවාරි මස 12 වැනි දින සභාවේ තීරණ යෝජනා අංක 04 යටතේ මෙයින් තීරණය කරමි.

04-280

---

**නවගත්තේගම ප්‍රාදේශීය සභාව**

සම්මත අතුරු ව්‍යවස්ථාව පිළිගැනීම

**1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව නවගත්තේගම ප්‍රාදේශීය සභාව විසින් 2019 ජනවාරි මස 14 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 96 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්.එම්.අයි.එස්. සේනාධිපති,
සභාපති,
නවගත්තේගම ප්‍රාදේශීය සභාව.

2019 මාර්තු මස 11 වැනි දින,
නවගත්තේගම ප්‍රදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ දෙවැනි වගන්තිය යටතේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015.09.25 වැනි දින අංක 1933/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටස - පළාත් සභා හි පළ කරනු ලැබූ 2016.03.25 වන දින පවත්වන ලද වයඹ පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරන ලද 2016.08.03 වැනි දින අංක 1978/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ප්‍රාදේශීය සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු වයවස්ථාව මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නවගත්තේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

04-281

---

**වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව**

උතුරු පළාතේ ප්‍රාදේශීය සභාවලට අනුමත කල අතුරු ව්‍යවස්ථා පිළිගැනීම

**1989 වර්ෂයේ අංක 12 දරන පළාත් පාලන අධිකාරියේ (අතුරු ව්‍යවස්ථා) පනත**

1989 වර්ෂයේ අංක 12 දරන පළාත් සභා (අතර සෘජු ප්‍රතිඵල විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (17 වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවනු ලබන 1952 වර්ෂයේ අංක 06 දරන පළාත් පාලන අධිකාරියේ අතුරු ව්‍යවස්ථා පනතේ 2වන වගන්තියේ (1) වන උප වගන්තියේ පළාත් සභා විෂයෙහි පළාත් පාලන ආයතනවලට වගකියන අමාත්‍යතුමාට හිමි බලතල අනුව උතුරු පළාතේ ප්‍රධාන ඇමති සහ මුදල් හා සැලසුම් නීතිය හා සාමය ඉඩම් විදුලිබල නිවාස ඉදිකිරීම් සංචාර පළාත් පළාත් පාලන පළාත පරිපාලනය ග්‍රාම සංවර්ධන මාර්ග සංවර්ධන රථ වාහන ගමනා ගමන සංවිධාන හා ගමනා ගමන ආදියේ ගරු අමාත්‍ය හිටපු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර කේ. වී. විග්නේස්වරන් මැතිතුමා විසින් සකස් කරනු ලැබ අංක 2070/11 හා 2018 මැයි 9 වැනි දින ප්‍රකාශයට පත්කරන ලද (අති විශේෂ) උතුරු පළාතේ ප්‍රාදේශීය සභා සඳහා අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා කෙටුම්පතේ 07 වන පරිච්ඡේදයේ සිට 09 වන පරිච්ඡේදය දක්වා අතුරු ව්‍යවස්ථා පනතේ 2(2) (අ) වගන්තිය අනුව උතුරු පළාතේ තිබෙන වවුනියා දිස්ත්‍රික්කයේ පිහිටා ඇති වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ 2018.05.09 වැනි දින සිට ක්‍රියාත්මක කරන බව අංක VSTPS/2019/2/12/150 හා 2019.02.08 දින දරන සභා තීරණය අනුව පිළිගන්නා අතර ඉහත ප්‍රකාශ කරන ලද (අතුරු ව්‍යවස්ථා) පනතේ 2 (2) (ආ) වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා කෙටුම්පතේ ඇතුළත් විධිවිධාන ඇතුළත් අතුරු ව්‍යවස්ථා පැනවීමටත් 1987 වර්ෂයේ අංක 18 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය සමග නියවිය යුතු 122 වන වගන්තිය හරහා මෙයින් භාරගනු ලැබේ.

ටී. නඩරාජසිංගම්,
සභාපති,
වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව.

වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව,
නේරියකුලම් පාර,
නෙලුක්කුලම්
වවුනියාව
2019 මාර්තු මස 01 වැනි දින.

04-348

## දැරණියගල ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 සහ 24 (2) වැනි වගන්තිය යටතේ කරන දැන්වීම

2019.03.07 වැනි දින පවත්වන ලද දැරණියගල ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ දී යෝජනා අංක 1 (i) යටතේ සම්මත වූ යෝජනාව අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දැරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් දැරණියගල ප්‍රදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් දක්වා ඇති මෙම මංමාවත සම්බන්ධයෙන් අදාළ ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් විරුද්ධතාවයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනයේ සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත නිසි අධිකරණයෙහි නඩුවක් පවරා තම විරෝධතාවයන් ලිඛිතව දැරණියගල ප්‍රාදේශිය සභාවේ සභාපති වෙත ලේඛනගත තැපෑලෙන් එවන ලෙස 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.


ඒ. බී. ඩබ්. ලක්ෂ්මන් රාජකරුණා,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2019 මාර්තු මස 15 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය 01

ගල් පඩිපෙළ මාර්ගය

| *ග්‍රාම නිලධාරී-කොට්ඨාස* | *පාරේ අංකය* | *පාරේ නම* | *දුර කි.මී.* | *පළල අඩි* | *පාරේ තත්වය* | *පාර විහිදී යන ඉඩම්වල විස්තර* |
|---|---|---|---|---|---|---|
| මාළිබොඩ වසම 112 | 1 | ගල් පඩිපෙල මාර්ගය (ඔරුපීල්ලගම මාර්ගයේ උමංදොල හන්දියේ සිට කොස්මණ්ඩිය නොම්මර 12 දක්වා යන වතුපාරේ හතරමං හන්දිය දක්වා) | මීටර් 521 | අඩි 12 | වාහන ගමන් කරන පොදු මාර්ගය | *පාරේ දකුණු පස :* බගවන්තලාව වතු සමාගමට අයත් මාළිබොඩ වත්ත. *පාරේ වම් පස :* බගවන්තලාව වතු සමාගමට අයත් මාළිබොඩ වත්ත. |



එම්.එල්.විජේතිලක
බලයලත් මිනින්දෝරු
තලමිතිකරු සහ
උසාවි කොමසාරිස්
පල්ලියපාර
දැරණියගල
036-2249622
පිඹුරු අංකය : 2428
කොස්මණ්ඩිය කොටස
නිවාසවල සිට
නිවාසවලට
මාලිබොඩ වත්ත
මාලිබොඩ වත්ත
නිවාසවලට
පරිමාණය 1 : 2000
මාලිබොඩ වත්ත
මාලිබොඩ වත්ත
පාර
සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ
අටුළුගම් කෝරළේ නැගෙනහිර මාලිබොඩ ගමේ පිහිටි
මලිබොඩවත්ත හරහා උමංදොල හන්දියේ සිට
කොස්මණ්ඩිය කොටස දක්වා පවතින පාර මැන පෙන්වන
පිඹුර
මායිම් :- ඉහත දැක්වෙන පරිදිය
පාරේ බිම් ප්‍රමාණය :- හෙක්ටයාර්. 0.1930 (අ. 0 : රූ. 1 : පර්. 36.3 )
පාරේ දිග මීටර් 521 , පළල අඩි 12
මැනීම කළේ:-2019 -01-25.
මාලිබොඩ සිට
එම්. එල්. විජේතිලක
බලයලත් මිනින්දෝරු
තලමිතිකරු, තක්සේරුකරු සහ
උසාවි කොමසාරිස්
පල්ලිය පාර, දැරණියගල.
2019-01-26


04-378

# විවිධ දැන්වීම්

## දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

2019 වර්ෂය සඳහා පෞද්ගලික පෙර පාසල්හි ක්‍රීඩා උත්සව, අවුරුදු උත්සව හා විවිධ ප්‍රසංග සඳහා ක්‍රීඩාංගණ වෙන්කිරීමේ ගාස්තු අයකිරීම

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව විසින් 2019 වර්ෂයේ පෙබරවාරි මස 07 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 06 (VI) 11(I) යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නාවලගේ සටැන්ලි ඩයස්,
නගරාධිපති.

යෝජනාව

පෞද්ගලික පෙර පාසල් ක්‍රීඩා උත්සව, අවුරුදු උත්සව හා විවිධ ප්‍රසංග සඳහා ක්‍රීඩාංගන වෙන් කිරීමේ ගාස්තු පහත සඳහන් පරිදි පනවා අය කිරීමට දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව යෝජනා කරන්නීය.

| ක්‍රීඩාංගණය | මුදල රු. ශත | NBT රු. ශත | VAT රු. ශත | මුළු මුදල රු. ශත |
|---|---|---|---|---|
| *ජයසිංහ ක්‍රීඩාංගණය* | | | | |
| ක්‍රීඩා උත්සව, අවුරුදු උත්සව හා විවිධ ප්‍රසංග සඳහා | 10,000.00 | 200.00 | 1,530.00 | 11,730.00 |
| පෙර පුහුණුව සඳහා | 5,000.00 | 100.00 | 765.00 | 5,865.00 |
| *සරණංකර ක්‍රීඩාංගණය* | | | | |
| උත්සවයක් සඳහා - ක්‍රීඩා උත්සව, අවුරුදු උත්සව හා විවිධ ප්‍රසංග සඳහා | 8,000.00 | 160.00 | 1,224.00 | 9,384.00 |
| පෙර පුහුණුව සඳහා | 4,000.00 | 80.00 | 612.00 | 4,692.00 |
| *අත්තිඩිය සහ වෙනත් ක්‍රීඩාංගණ* | | | | |
| උත්සවයක් සඳහා - ක්‍රීඩා උත්සව, අවුරුදු උත්සව හා විවිධ ප්‍රසංග සඳහා | 2,500.00 | 50.00 | 382.50 | 2,932.50 |
| පෙර පුහුණුව සඳහා | 1,000.00 | 20.00 | 153.00 | 1,173.00 |

04-224

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.